ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

# පුරප්පාඩු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන) (පුරප්පාඩු 01)

සේවා ශ්‍රේණිය : කළමනාකාර සේවා ශ්‍රේණිය (MM 1 – 1)

වැටුප් පරිමාණය : MM 1 - 1 - 2025 රු:91,690 – 10 x 2,480 – 15 x 3,450 - 168,240/=(මාසික)
(ක.සේ.ව.අංක 01/2025 අනුව 2025.01.01 දිනට රු:71,730 /=ක්ද, 2026.01.01 දිනට රු:81,710/=ක්ද සහ 2027.01.01 දින සිට රු:91,690/=ක් ලෙස ද වැටුප් ගෙවනු ලැබේ.)

වයස : අවු:22 ට නො අඩු හා අවු:45 ට නො වැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් (කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යා විෂයයකින්) ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන(03)ක පළපුරුද්දක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හා අදාළ විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා සමත් වී තිබීම.

සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන(03)ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන : පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය : විවෘත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**සේවා කොන්දේසි :**

1. මෙම තනතුර ස්ථිර වන අතර, අවුරුදු තුන(03)ක පරිවාස කාලයකට යටත් වේ.
2. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8%ක් ගෙවිය යුතු අතර, සේවායයා විසින් 12%ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3%ක්ද ගෙවනු ලැබේ.

**ඉහත තනතුරු සඳහා රාජකාරි ස්ථානය - කොළඹ**

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු තම අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු ගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකය ද ඇතුළත් කර අයදුම්පත අදාළ සහතික වල පිටපත් ද සමඟ "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත - කොළඹ 07" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.25 දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර තිබිය යුතුය.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරනු ලබන අයදුම්කරුවන් ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තුව / ආයතන ප්‍රධානියා ගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වා ඇති සියලුම අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත - කොළඹ 07.
Website : www.natlib.lk